
# හම්බන්තොට දිස්ත්‍රික්කය

## සමාජ-සංස්කෘතික උරුමය



මධ්‍යම සංස්කෘතික අරමුදල

## 2.5 තිස්සමහාරාමයේදී මියගිය පුරාවිද්‍යාඥයා

එක්දහස් අටසිය අනුව පුරාවිද්‍යා සමීක්ෂණය ආරම්භ වීමෙන් පසුවම දකුණු පළාතේ පුරාවස්තූන් පිළිබඳ කිසිදු ගවේෂණයක් සිදුකර නොතිබිණි. එබැවින් දකුණු පළාත ගවේෂණය කිරීම සඳහා එක්දහස් නවසිය දහහතර දී මාස කිපයක ක්ෂේත්‍ර චාරිකාවක් අයර්ටන් සැලසුම් කෙළේ ය. මෙම ගවේෂණය අතරතුර තිස්සමහාරාම වැවේ කුරුලු දඩයමේ ගිය අයර්ටන් එක්දහස් නවසිය දාහතරේ මැයි දහහතර වන දින අවාසනාවන්ත ලෙස දියේ ගිලී මරණයට පත්වි ය.

අයර්ටන් මෙම දෛවෝපගත චාරිකාව සඳහා අනුරාධපුරයෙන් පිටත් වූයේ එක්දහස් නවසිය දහහතරේ පෙබරවාරි දහසය වැනිදා ය. එම චාරිකා සටහන් ඇතුළත් පිටු අසුවකින් යුත් ඔහුගේ දිනපොතේ අවසන් සටහන් තබා ඇත්තේ ඉන් තුන් මසකට පසු මැයි දහසය වැනිදා ය. මේ දිනපොතේ සටහන් පසුව **ජෝන් එම්. සෙනෙවිරත්න** විසින් *"The Ceylon Antiquity and Literary Register"* හි කොටස් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත.

අයර්ටන්ගේ අකල් මරණය සහ ඔහු ගැන ඔහුගේ ඊජිප්තු මිතුරන් විසින් ලියන ලද සැමරුම් සටහනක් *"Journal of Egyptian Archaeology"* නමින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත. **ඒ.එම්. හෝකාර්ට්** විසින් උපුටා දක්වා ඇති එම සටහන අයර්ටන් පිළිබඳ අවබෝධයක් ලැබීම සඳහා වැදගත් ය.

ලංකාවේ පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූ ඊ.ආර්. අයර්ටන් මහතා දඩයමේ යෙදී සිටියදී කලපුවක ගිලී මියගිය පුවත වාර්තා ගත කිරීමට සිදුවීම ඉමහත් වේදනාවට කරුණකි. අරමුදල සඳහා මහාචාර්ය නෙවිල් සමග මෙන් ම තියඩෝර් ඩේවිස් සමග ද බිබාන් එල්-මුලක් හි වැඩකළ අයර්ටන් මහතා අප බොහෝ දෙනෙකුගේ අගනා පෞද්ගලික මිත්‍රයෙකු වන අතර, වයස අවුරුදු තිස් දෙක තරම් අඩු වයසේදී මියයාම බොහෝ දෙනෙකුගෙන් සිත් පාරවනු ඇත. පළමු පෙළේ කැණීම්කරුවෙකු මෙන් ම රූපාක්ෂර විද්‍යාව උගත් විද්‍යාඥයෙකු වූ අයර්ටන්ගේ අභාවය පුරාවිද්‍යාවට විශාල පාඩුවකි. ඔහුගේ දැනුම සහ විචක්ෂණභාව මෙන් ම තම සගයන් සමග සැමවිටම තිබුණු ප්‍රීතිමත් සම්බන්ධතාවයන්වලට **තියඩෝ ඩේවිස්** මහතාගේ **රාජකීය සොහොන්** සොයාගැනීමේ කටයුතුවල ගෞරවයෙන් වැඩි කොටසක් හිමි ය. ලංකාවේ ඔහු ලැබූ නව පදවිය සඳහා ඔහුගේ මාරුවී යාම තම සගයින්ගේ පසුතැවිල්ලට බෙහෙවින් ලක්වුයේ තරුණ පරපුරේ ඊජිප්තු විශේෂඥයින් අතරින් ඇතැම් විට දීප්තිමත් අනාගතය හිමිවූ තැනැත්තා අපට අහිමි වීම නිසා ය. අපට මෙන්ම ඉන්දියාවේ සහ ලංකාවේ පුරාවිද්‍යා සමීක්ෂකයින්ට ද ඔහුගේ අභාවය බරපතල ලෙස දැනෙනු ඇත."

එච්.සී.පී. බෙල්ට පසුව පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් පත් වුයේ ඊ.ආර්. අයර්ටන් ය. ඔහු දක්ෂ, තරුණ පුරාවිද්‍යාඥයෙකු වූ අතර ක්‍රමානුකූල සැලැස්මක් මත මෙරට පුරාවිද්‍යා පර්යේෂණ කටයුතුවලට අවතීර්ණ වි ය. එහෙත් අවාසනාවන්ත ලෙස අකල් මරණයකට ගොදුරු වීම නිසා මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයට ඔහුගෙන් ලැබුණු සේවය වර්ෂ එකහමාරකට පමණ සීමා වි ය. එය ඉතා කෙටි කාලයක් වුවත්, ශ්‍රී ලංකා පුරාවිද්‍යා පර්යේෂණ ඉතිහාසය තුළ එය එක් සුවිශේෂ කාලපරිච්ඡේදයක් ලෙස සනිටුහන් කළ හැකි ය.

සහකාර පුරාවිද්‍යා කොමසාරිස් ලෙස කටයුතු කළ ජෝන් ස්ටිල් එක්දහස් නවසිය අටේ දී සිය තනතුරෙන් ඉල්ලා අස්වීම නිසා එච්.සී.පී. බෙල්ට පසුව පුරාවිද්‍යා කොමසාරිස් තනතුරට පත් කරනු ලබන්නේ කවුරුන් ද යන්න ලංකාණ්ඩුවේ බලධාරීන්ට ගැටලුවක් වි ය. ඒ සඳහා ඉන්දීය පුරාවිද්‍යා සමීක්ෂණයේ නිලධාරියෙකු ලබාදෙන ලෙස ලංකාණ්ඩුකාර මැකලම් විසින් ඉල්ලීමක් කරන ලද නමුත්, තම කණ්ඩායමේ කිසිවෙකු නිදහස් කිරීමට එහි ප්‍රධානියා වූ ජෝන් මාෂල් කැමති නොවි ය. ඒ වෙනුවට ඔහු යෝජනා කෙළේ එක්කෝ පළපුරුදු පුරාවිද්‍යාඥයෙකු සොයාගෙන ඔහුට දේශීය භාෂාවන් පිළිබඳ පුහුණුවක් ලබාදෙන ලෙස හෝ නැතහොත් භාෂා විශේෂඥයෙකු තෝරාගෙන ඔහුට පුරාවිද්‍යා දැනුමක් ලබාදී මෙම තනතුරට බඳවා ගන්නා ලෙස ය.

එච්.සී.පී. බෙල් මේ සම්බන්ධව දැරුවේ මීට වෙනස් අදහසකි. උක්ත තනතුරට පත්වන්නා පළමුව දේශීය තත්ත්වයන් පිළිබඳ දැනුමක් ඇති පුද්ගලයෙකු විය යුතු බවත් විශ්වාස කළ බෙල් තම අනුප්‍රාප්තිකයා ලෙස සිවිල් නිලධාරියෙකු වූ එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන් ගේ නම යෝජනා කළේ ය. මැකලම් ආණ්ඩුකාරයා ද එම යෝජනාවට කැමති වූ නමුත් යටත් විජිත භාර ලේකම් වරයා වූ ක්‍රීවේ ස්වාමිවරයා ඊට එකඟ නොවි ය. ඔහු දැඩි ලෙස විශ්වාස කෙළේ ලංකාවේ ඊළඟ පුරාවිද්‍යා කොමසාරිස්වරයා පුහුණු වෘත්තීය පුරාවිද්‍යාඥයෙකු විය යුතු බව ය.

ඒ අනුව යටත් විජිත ලේකම් කාර්යාලය විසින් ගයි ඩිකින්ස් එම තනතුර සඳහා තෝරා ගනු ලැබ